# ජෙනරාල් හා ජෙනරාල් හෙවත් ලංකාව මියන්මාරයක් කිරීම

සරත් ෆොන්සේකා නැවතත් බීබීසියට කතාකර ඇත. ඔහු කියා ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා ලේකම් හෙවත් ලේකම් ජෙනරාල් (සෙකට්‍රි ජෙනරාල්) ලංකාවේ ඊනියා මානව අයිතිවාසිකම් පිළිබඳ පත්කර ඇති කමිටුව ඉදිරියේ සාක්ෂි දීමට හෝ ඒ කමිටුවට තොරතුරු සැපයීමට හෝ තමා සූදානම් බව ය. සරත් ෆොන්සේකා හිටපු ජෙනරාල් වරයෙකි. බෑන් කි මූන් ද කිනම් අර්ථයකින් ගත්ත ද ජෙනරාල් කෙනෙකි. මොන ජෙනරාල් වුවත් ඔවුන් දෙදෙනා ම වැඩ කරන්නේ බටහිරයන්ගේ පොතට අනුව ය. මේ පොත කල්තබා විවරණය කිරීමට නොහැකි ව මෙරට උගත්තු ඉබාගාතේ යති. එයට ප්‍රධාන හේතුව ඔවුන් බටහිරයන්ගේ පොතෙන් පමණක් උගත් පොතේ උගතුන් වීම ය. ඔවුන් බෞද්ධ පොතපත කියෙව්ව ද ඒ කියවන්නේ ද බටහිර ඇසිනි. නිරීක්ෂකයාගෙන් තොරව ක්ෂණයකට වුව ද ඊනියා බාහිර ලෝකයක පැවැත්ම පිළිගන්නා ඔවුහු චතුස්කෝටිකය ද්විකෝටිකයට ඌනනය කිරීමට උත්සාහ කරති.

සරත් ෆොන්සේකාගේ සුදු කොඩි කතාව හෙළිදරවු වූ කාලයේ දී ම අපි සිදුවීමට යන්නේ කුමක් දැයි පැහැදිලිව ම කීවෙමු. මහින්ද රාජපක්ෂ මහතාත් ගෝඨාභය රාජපක්ෂ මහතාත් දංගෙඩියට යැවීම මේ කතාව සමග බැඳී ඇති බව අප කීවේ බටහිරයන්ගේ පොත පිළිබඳ ව හා ඔවුන්ගේ ජෙනරාල්ලා පිළිබඳ ව අපට මනා අවබෝධයක් ඇති බැවිනි. එහෙත් අවාසනාවකට මෙරට උගත්තු අප කියන ලියන දේ ඉවත දමති. ජාතික ව්‍යාපාරයෙහි යෙදී සිටින අය ද ඒ ප්‍රකාශ නොකළා සේ සිටිති. මා ලියන ලිපිවලින් එතරම් වැඩක් නැත යන මතයට එළඹීමට සිදු වේ ද? ඒ ලිපි අගයන්නකු සොයාගැනීම කළුනික සෙවීම වැනි දුෂ්කර ක්‍රියාවක් බවට පත් වී ඇත. ඒ ලිපි එකතු කර පළකරන ලද පොතකින් පිටපත් දෙසීයක් විකුණාගැනීමට අවුරුද්දකට ආසන්න කාලයක දීත් නොහැකි වී ඇත.

මා මෙතෙක් කල් ලියුවේ මගේ ප්‍රතිවාදීන් තර්කයෙන් පරාජය කිරීමට ද මිස ඔවුන්ට එත්තු ගැන්වීමට නො වේ. සාමාන්‍යයෙන් කිසිවකු තර්කයකින් පරාජය වී අනෙකාගේ මතය පිළිගන්නා බවක් මම නො දනිමි. සුළු කරුණක දී ඒ එසේ වනවා ඇත. එහෙත් පෘථග්ජන පුද්ගලයන් තම අදහස් වෙනස්කර ගන්නේ තර්කයකින් විවාදයකින් පැරදීම නිසා නොවන බවට වුවමනා තරම් සාක්ෂි ඉදිරිපත් කළ හැකි ය. මගේ වෑයම ප්‍රතිවාදීන්ට එත්තුගැන්වීම නොව ඔවුන්ගේ නිසරු තර්ක හා මත අනෙක් අයට හෙළිදරවුකිරීම හා එමගින් තරුණ පරම්පරාව වෙනත් අදහස්වලට යොමු කිරීම ය. එහෙත් අවාසනාවකට තරුණ පරම්පරාව මේ ලිපි කියවන්නේ ඉතා අඩුවෙනි. පසුගිය දා ඊනියා යුද්ධය තිබූ සමයේ ජාතික මතවාද ව්‍යාප්ත වූ අයුරු ගැන ඊනියා පර්යේෂණයක් කරන විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යාවක් මා හමුවීමට පැමිණියා ය. ඇය ඊනියා පර්යේෂණයක් කරන්නියක බැවින් පොතපත කියවා ඇතැයි මම සිතුවෙමි. එහෙත් ඇය මා ලියා ඇති ලිපි දහයක්වත් කියවා නොමැති අතර ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා මස්සිනාලා පොත ද කියවා නො තිබිණි. මේ ලිපි ලිවීමෙන් එතරම් වැඩක් ඇත් ද යන ප්‍රශ්නය නිරන්තරයෙන් ම මගේ සිතට නැගෙයි. එදා මෙන් නොව අද ජාතික ව්‍යාපාරය වෙනුවෙන් ලිවීමට හා කතාකිරීමට බොහෝ අය සැදී පැහැදී ඇත. ඉලෙක්ට්‍රොනික තැපැල මගින් ද ඒ අයගේ ලිපිවලට ප්‍රචාරයක් ලැබෙයි. බොහෝ විට කියවිය යුතු ම ලිපි ලෙස ඒ ඇතැම් ලිපි නිර්දේශ කෙරෙයි. මා ලියන ලිපි එසේ නිර්දේශ නොකෙරෙන්නේ ඔවුන්ට එහි වැදගත්කමක් නොතිබීම නිසා විය හැකි ය.

එහෙත් ඇතැම් සංසිද්ධි ගැන ලිවීමට සිදුවන්නේ බටහිරයන්ගේ ක්‍රියාමාර්ග ගැන ඔවුන්ගේ පොතෙන් පිට පැන කීමට කරුණු ඇති බැවිනි. උගතුන්ට වැදගත්වන්නේ බටහිරයන්ගේ පොතේ ඇති දෑ ය. වෙනත් කරුණු සම්බන්ධයෙන් සුළු සුළු වෙනස්කම් සහිත වුව ද බටහිරයන්ගේ පොත්වල ඇත්තේ එකම සත්භාවයකි. ඒ ඇරිස්ටෝටලීය නිව්ටෝනීය අයින්ස්ටයිනීය සත්භාවයයි. ඔවුහු ඥානවිභාග වශයෙන් ගත්කල මූලික වශයෙන් යථාර්ථවාදී හෝ ඉන්ද්‍රියානුභූතවාදී හෝ වෙති. මේ වෙනස සත්භාවය සමග සැසඳූ කල සුළු වෙනසකි. (පෙරදිග දර්ශනයෙහි සත්භාවය හා ඥානවිභාගය ප්‍රභින්න වශයෙන් නො සැළකෙයි) මෙරට ඇතැම් බෞද්ධයෝ ද ඇරිස්ටෝටලීය නිව්ටෝනීය අයින්ස්ටයිනීය සත්භාවය පිළිගනිති. ඒ මදිවාට ඔවුහු යථාර්ථවාදීහු ද වෙති.

ලේකම් ජෙනරාල් මෙන් ම හිටපු ජෙනරාල් ද බටහිරයන්ට සේවය කරති. ඒ අර්ථයෙන් ගත්කල ඔවුහු එකම ක්‍රියාවලියක දැති දෙකක් පමණක් වෙති. හිටපු ජෙනරාල්ට බීබීසිය කතාකරන්නේත් වෙනත් සිරකරුවන්ට නොමැති තත්වයක් ඔහුට ලැබී ඇත්තේත් ඔහු ලේකම් ජෙනරාල්ගේ අවශ්‍යතාව ඉටුකරන බැවිනි. එහෙත් ජෙනරාල්ලා දෙදෙනාම පඹයෝ පමණක් ම වෙති. ඔවුන්ට පැවැත්මක් ඇත්තේත් වැදගත්කමක් ඇත්තේත් අපේ පැත්තෙන් බැලූ කල කිසිම

© Prof. Nalin De Silva

වැදගත්කමක් නැති එහෙත් අප රටවලට ද්‍රෝහී වූ බීබීසියෙන් ඔවුන්ට ප්‍රචාරය ලැබෙන්නේත් බටහිරයන්ට ඔවුන්ගේ සේවය (ඔවුහු නියම සේවකයෝ වෙති) අවශ්‍ය වන බැවිනි. අද බටහිරයන් ලංකාවේ දී සරත් ෆොන්සේකා අවුං සාන් සූකී කෙනකු බවට පත්කිරීමට යන බව පැහැදිලි ය. මෙරට බොහෝ බෞද්ධයනට සූකී වීරවරයකි. ඔවුන් සිතන්නේ මියන්මාරයේ ඊනියා මිලිටරිවාදයක් ගැන ය. බටහිරයන් මියන්මාරයේ බුද්ධදහම වෙනුවෙන් පෙනී සිටින්නේ යැයි සිතන්නේ නම් නරින්ට කුකුළන් භාරදිය හැකි යැයි ද සිතිය හැකි ය. මියන්මරයේ ජෙනරාල්ලා ඉහත සඳහන් ජෙනරාල්වරු දෙදෙනාට වෙනස් වෙති. මියන්මාර ජෙනරාල්ලා සර්වතොභද්‍ර යැයි මෙයින් නො කියැවෙයි. එහෙත් බටහිරයන්ගේ ත්‍රස්තවාදය හමුවේ ඔවුහු ප්‍රශංසනීය ලෙස ක්‍රියා කරති. බටහිරයන්ට අද අවශ්‍ය ලංකාව තවත් මියන්මාරයක් බවට පත්කිරීමට ය. මේ රටවල් දෙකම ථෙරවාදී රටවල් බව අමතක නොකළ යුතු ය. බටහිරයන් අප රටට දුන් ජී එස් පී සහනය ඉවත්කරගෙන ඇත. වැඩිකල් නොගොස් අපට ආර්ථික සම්බාධක පමුණුවනු ඇත. සිංහලයන්, විශේෂයෙන් ම සිංහල බෞද්ධයන් කුසගින්නේ තබා හැකිනම් මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුව පෙරළා දැමීමට ඔවුන් උත්සාහ කරනු ඇත. එහි දී ඔවුන් යොදාගන්නා ප්‍රධාන අවිය වනුයේ හිටපු ජෙනරාල් සරත් ෆොන්සේකා ය. එයට පළමු සරත් ෆොන්සේකාගේ ද්‍රෝහීත්වය තව තවත් රටට පැහැදිලි කළ යුතු ය.

ජී එස් පී ගිවිසුම මුලින් ම අත්සන්කිරීම ම මුග්ධ ක්‍රියාවකි. යුරෝපා සංගමය අපට බදු සහනයක් දුන්නේ කොන්දේසි සහිත ව මිස රහිත ව නො වේ. මේ කොන්දේසි රටට අහිතකර ඒවා විය. ලංකාව ද සමග ඒ ගිවිසුම් අත්සන් කර ඇත්තේ රටවල් පහක් පමණකි. අද රනිල් වික්‍රමසිංහ සුපුරුදු පරිදි මහජනයා නොමග යවන්නේ ඔවුන්ට කොන්දේසි විරහිතව ජී එස් පී ලබාගත හැකි යැයි පවසමිනි. මුල් ගිවිසුම ම රටට හානිදායක කොන්දේසි ඇතිව අත්සන් කළ එකක් බව ඔහු ජනතාවගෙන් වසං කරයි. යුරෝපා සංගමය ජී එස් පී බදු සහනය ඉවත්කර ගැනීම රටට වූ යහපතක් ලෙස සළකා ඉදිරි දර්ශනයක් ඇතිව ආණ්ඩුව වැඩ කළ යුතු වෙයි. ඊනියා මානව අයිතිවාසිකම් කාගේ මානව අයිතිවාසිකම් ද යන්න අපි කිහිප විටක් ම පැහැදිලි කර ඇත්තෙමු. කොටින්ට විරුද්ධව කළ මෙහෙයුම්වලට විරුද්ධ වූ ද එයට සමච්චල්ල කළාවූ ද රනිල් වික්‍රමසිංහ ප්‍රධාන එ ජා පක්ෂය අද බටහිරයන්ට මුහුණ දෙන්නේ කෙසේ දැයි උගන්වන්නේ රෙදි ඇඳගෙන විය නො හැකි ය.

අද ලංකාවට විරුද්ධව බටහිර ප්‍රධාන රටවල් දෙක ප්‍රසිද්ධියේ ම ඉදිරිපත් වී ඇත. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ප්‍රධාන ප්‍රභේදය වූ ඇංග්ලො සැක්සන් සංස්කෘතියේ ප්‍රධාන රටවල් දෙක වූ ඇමරිකාව හා එංගලන්තය (අවශ්‍ය නම් ඊනියා එක්සත් රාජධානිය) ප්‍රසිද්ධියේ ම ලංකාවට විරුද්ධ ව තම සැලැස්ම ක්‍රියාත්මක කරයි. පසුගිය කාලයේ ඔවුහු තම අවශ්‍යතාව සඳහා නෝර්වේ යොදාගත්හ. මෙරට සිටින හැදිම්ටේ උගත්තු නොර්වේ රට මන්නාරමේ තෙල් ආකරවලට කැදරව කොටින්ට පක්ෂව කටයුතු කරන බවට ආර්ථික හේතු ඉදිරිපත් කළහ. බටහිර යටත්විජිතවාදයේ ආර්ථික සංරචකයක් ඇත. එහෙත් සියල්ල ආර්ථිකයට (හෝ සංස්කෘතියට හෝ) ඌනනය කිරීම බටහිරයන්ගේ ඌනිතවාදය පසුපස යැමකි. අද මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට විරුද්ධව කටයුතු කිරීමට නෝර්වේ ප්‍රමාණවත් නොවන බව එංගලන්තය හා ඇමරිකාව දනියි. බටහිරයන්ගේ සැලසුම්වලට සාර්ථක ව මුහුණ දී ඒ පරාජය කිරීමට අප සූදානම් විය යුතු ය. සරත් ෆොන්සේකා සූකී කෙනකු කර ආර්ථික තහංචි පනවා මෙරට තවත් මියන්මාරයක් බවට පත්කිරීමට එරෙහිව අප පළමුවෙන් ම ඉගෙනගත යුත්තේ ද මියන්මාරයෙන් ම ය. අද අපේ සියළු සංවර්ධන කටයුතුවල තේමාව විය යුත්තේ යෝධ වැව ද ඇතුළු වැව් ප්‍රතිසංස්කරණය කර වී ගොවිතැන ඉක්මණින් ම වැඩි දියුණු කිරීම ය. කෘමි නාශක නොමැතිව රසායනික පොහොර නොමැතිව වී වගාකරන්නේ කෙසේදැයි අපි කැලණිය සරසවියේ අත්හදා බලමින් සිටින්නෙමු. ඒ ඊනියා කාබනික පොහොර දැමීමකින් කරන්නක් නොව පෘතුගීසීන් මෙරටට පැමිණීමට පෙර තිබූ අපේ දැනුම උපයෝගී කරගෙන කෙරෙන්නකි. ආණ්ඩුව ප්‍රමුඛත්වය දිය යුත්තේ ආහාරයෙන් මෙන් ම දැනුමෙන් ද ස්වයංපෝෂිත වීමට ය. මියන්මාරය හාමතේ තැබීමට බටහිරයන්ට නොහැකි විය. අප බටහිර ආර්ථික, වෛද්‍ය හා වෙනත් දර්ශක මත පදනම් නොවී නිරෝගී තුන්වේල කන සතුටින් ජීවත්වන ජනතාවක් ඇතිකර ගත යුතු ය. අද සෑම පාසලකට ම පිහිනුම් තටාකයක් නොව අපේ දැනුමෙන් කරන කුඹුරක් තිබිය යුතු ය. කොළඹ රාජකීය විද්‍යාලය එහි දී ද අත්හදා බැලීමක් කර තිබීම රටේ යහපතට හේතුවනු නො අනුමාන ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva